## The year of thanksgiving – Blessed to be a blessing

### ස්තුතිදීමේ අවුරුද්ද- ආශීර්වාදයක් වීමට ආශීර්වාද ලබා ඇත. (03.02.2019)

දීමෙන් ලැබෙන ආශීර්වාද ගැන ඔබට පෙන්වීමට මට අවශ්‍යයි. දිළිඳුකමේ මානසිකත්වයෙන් අපව ඉවතට ගෙන, අප සේවය කරන, අපට අවශ්‍ය කරනවාටත් වඩා සෑහෙන දෙවියන්වහන්සේ ගැන දැනගැන්මටත් අත්දකින්නටත් හැකි මානසිකත්වයක් වෙතට අපව ගෙන යන බයිබලීය මූලික ප්‍රතිපත්තිවල අගුලු අරින්නට අපට උපකාරවීමට මට අවශ්‍යයි.

2 කොරින්ති 9:6-13

1.ඔබ ටිකක් දුන්නොත් ඔබ ටිකක් ලබයි. බීජ කීපයක් වපුරන ගොවියෙක් පොඩි අස්වැන්නක් ලබයි, නමුත් ඔහු වැඩිපුර වැපිරුවොත් ඔහු වැඩි අස්වැන්නක් නෙලාගනු ඇත. මෙය දෙවියන්වහන්සේගේ ආර්ථිකයේ ප්‍රධාන ප්‍රත්පත්තියයි. ඔබ ටිකක් දුන්නොත් ඔබට බොහෝ වැඩියෙන් ලැබෙනු ඇතැයි මේ සමාජය කියන ආකාරයට වඩා මෙය පරස්පරවිරෝධී වේ. වැඩිපුර දීමෙන් අඩුවීමක් නොව බොහෝ ලෙස වැඩිවීමක් සිදුවන බව බයිබලය අපට පවසයි.

ඔබ වැඩියෙන් ස්තුතිදීම දෙනවිට ඔබට එය නැවත වැඩිපුර ලැබෙනු ඇත.

ලූක් 6:38 එය මෙසේ පවසයි - දීපල්ලා ,එවිට නුඹලාටත් දෙනු ලැබෙන්නේය. ඔබමින්, සොලවමින්, උතුරවමින් නුඹලාගේ ඔඩොක්කුවලට හොඳකාරව මැනදෙනු ලැබෙන්නේය. මක්නිසාද නුඹලා යම් මිම්මකින් මැන දෙන්නහුද එයින්ම නුඹලාටත් මැනදෙනු ලැබෙන්නේය.

එබැවින් අපි දෙවියන්වහන්සේට ස්තුතිදීමේදී සහ අනෙක් අයට ආශීර්වාද කිරීමේදී එය හැකි තරම් වැඩියෙන් කරමු, මක්නිසාද එය ඔබට නැවත ලැබෙනු ඇත.

2.දෙවියන්වහන්සේ අගයකරන්නේ/ප්‍රේමකරන්නේ සතුටු සිතින් දෙන්නන්ටය. සතුටු සිතින් යනුවෙන් විස්තර කරන්නේ වළක්වා ගැනීමක් නැතිව ප්‍රීතියෙන් දෙන ආත්මයක්ය. දෙවියන්වහන්සේට ඔබේ ස්තුතිදීම නිරායාසයෙන්, ප්‍රීතිමත්ව, උතුරායමින් සහ මහත් සතුටින් කරන විට, දෙවියන්වහන්සේ එය අගයකරනසේක/එයට ප්‍රේමකරනසේක. එයින් ඇතිවන ප්‍රතිපලය ඉතාම අපූරුය. 8වන පදයː තවද නුඹලා සියලු දේවලදී නිතරම පූර්ණකම ලැබ සියලු යහපත් ක්‍රියා සඳහා පූර්ණව සිටින පිණිස නුඹලාට අවශ්‍ය කරන සියලුම දේවල් පමණක් නොව, සතුටු සිතින් අනෙක් අයට දෙන්නට හැකිවන පිණිස සියල්ලම වඩාත් වැඩිකර දෙන්නට දෙවියන්වහන්සේට පුලුවන. එය කොතරම් අපූරුද! අපගේ යහපත පිණිස අපගේ ජීවිතවලට අවශ්‍ය සියලුම දේවල් ලැබෙන්නේ දෙවියන්වහන්සේගේ අත්වලිනි. දෙවියන්වහන්සේ අති ශක්තිමත්ය, අති බලවත්ය.

අපගේ ස්තුතිදීම නිරායාසයෙන්ම, සතුටු සිතින්, ඉතාමත්ම ප්‍රබල ලෙස සිදුවන දෙයක් වේවා! මක්නිසාද දෙවියන්වහන්සේ එයට ප්‍රේම කරනසේක. දෙවියන්වහන්සේ එයට ප්‍රේමකරන බැවින් අනෙක් අයට ආශීර්වාද කරන පිණිස ඔබට අවශ්‍යකරන දේවල් ඕනෑවටත් වඩා ඔබට ලබා දෙන්නට සුපිරි හැකියාවක්, සුපිරි බලයක් සහ සුපිරි ශක්තියක් ඇතිව සිටිනසේක. (අනෙක් අයට ආශීර්වාද කරන පිණිස ඔබ ආශීර්වාද ලබා සිටී)

3. ඔබ ඉතා මහත් සතුටින් දෙන දීමනාවන් අනෙක් අයට ආශීර්වාදයක් වෙයි සහ ඔවුන්ගේ මුහුණුවල සිනාවක් උපදවයි. ස්තුතිදෙන හදවතකින්, නිවැරදි අභිමතයකින් සහ පරිත්‍යාගශීලී ආකල්පයකින් ඔබ දෙන විට එය අනෙක් අයටත් එය බෝවෙයි. එවිට ඔබේ ස්තුතිදීමේ දීමනාවන් ලබන ශුද්ධවන්තයන් එය වෙනුවෙන් දෙවියන්වහන්සේට ස්තුති කරනවා ඇත.

සිදුවනු ඇති කාරණා දෙකක් බයිබලය අපට පවසයි හිඟකම ඇති අයට උපකාරයක් වෙයි. ඔවුන් දෙවියන්වහන්සේට ස්තුතිදීමෙන් උතුරායයි. 13පදය ඔබ උපකාර කරන අය ඔවුන්ට සහ අනෙක් අයටත් ලැබෙන ඔබගේ පරිත්‍යාගශීලී දීමනාවන් නිසා සතුටු වෙනවා පමණක් නොව, ඔබේ දේවධර්මය තරමටම ඔබේ ක්‍රියාවන්ද යහපත් බව එයින් ඔප්පුවෙන බැවින් ඔවුන් දෙවියන්වහන්සේට ඒ ගැන ප්‍රශංසා කරනවා ඇත.

සහාව! අනෙක් අයට ආශීර්වාද කරන පිණිස අප ආශීර්වාද ලබා ඇත. එය එතරම් සරලයි! ඔබේ ස්තුතිදීම ධාර්මිෂ්ඨකමේ (දෙවියන්වහන්සේ සමඟ නිවැරදිව සිටීමේ) ක්‍රියාවකි. ඔබේ ස්තුතිදීමේ ක්‍රියාව දෙවියන්වහන්සේව ඔප්පු කරයි. උන්වහන්සේ සැබෑ බව ඔප්පු කරයි.

ස්තුතිදීම තුළ ආත්මතෘප්තිය, සෑහීමට පත්වීම සහ පූර්ණත්වයට පත්වීම පවතී.

එසේනම් ස්තුතිදීමේ අංගයන් මොනවාද?

**පළමුව,** ස්තුතිදීමට ලක්වන (විෂය ගෝචර) වන්නේ දෙව්පියාණන්- වහන්සේය. ස්තුතිදීම ගලා එන්නේ දේවපුත්‍රයාණන්

තුළිනි. ස්තුතිදීමේ මූලාශ්‍ර සම්පත වන්නේ ශුද්ධාත්මයාණන්වහන්සේය. රෝම 1:18 හි පාවුල්තුමා ස්තුති දෙයි. "පළමුකොට, නුඹලාගේ ඇදහිල්ල මුළු ලෝකයෙහි ප්‍රසිද්ධව තිබෙන නිසා නුඹලා සියල්ලන් ගැන යේසුස් ක්‍රිස්තුස්වහන්සේ කරණ කොටගෙන මාගේ දෙවියන්වහන්සේට ස්තුතිකරමි." කොලොස්සි 3:16-17 බලන්න.

**දෙවනුව**, අපේ ජීවිතවල පාපයට වෙනුවට ස්තුතිදීම ඇතිවෙයි. පාවුල්තුමා ඇදහිලිවන්තයන්ට පව්කිරීම නවත්වා ඒ වෙනුවට ස්තුතිදීම පවත්වන ලෙස අණකරන හැටි බලන්න. එපීස 5:4 කැත කතාද මෝඩ කතාද නීච කවටකම්ද නුඹලාට නුසුදුසුය. ඒවා නොව ඒ වෙනුවට ස්තුතිදීම් පවත්වාපල්ලා. එකිනෙකාට දෙවියන්වහන්සේගේ යහපත්කම මතක්කර දෙන්න, ස්තුතිවන්ත වෙන්න. එහි ස්තුතිදීම තිබේවා. අපට පාපිෂ්ඨ සිත් ඇතිව ස්තුතිවන්තකම නැතුව ක්‍රියාකළ හැකියි. නැත්නම් අපට ස්තුතිවන්ත සිත් ඇතුව ක්‍රියාකරමින් දෙවියන්වහන්සේට ප්‍රසන්න අය විය හැකියි.

**තෙවනුව**, 1තිමෝති 4:4-5 කියන ආකාරයට අපි දෙවියන්වහන්සේගේ මැවිල්ල ගැන ස්තුතිවන්ත විය යුතුයි. දෙවියන්වහන්සේ මැවූ සියල්ල යහපත්ය. ස්තුතිදීමෙන් යුක්තව පිලිගන්නවා නම් කොයි දෙයක්වත් එපා කරන්නට යුතු නැත. 5 මක්නිසාද එය දෙවියන්වහන්සේගේ වචනයෙන්ද යාච්ඤාවෙන්ද පිරිසිදු කරනු ලබන්නේය. උන්වහන්සේ අපට කර තිබෙන සියලුම යහපත් දේවල් ගැන අපි දෙවියන්වහන්සේට ස්තුතිවන්ත වෙන විට, උන්වහන්සේ අප උදෙසා මැවූ සහ අපට තිබෙන්නාවූ සෑම දෙයක්ම අපි අගය කරන අතර ස්තුතිවන්ත වෙන්නෙමු.

**සතරවෙනුව**, යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුළින් ගැලවීමේ ක්‍රියාව ගැන ස්තුතිදීම. අපේ පාපවලට මිදීමේ මිලයක් කොට උන්වහන්සේගේ ලේවලින් ගෙවන පිණිස අප උදෙසා උන්වහන්සේගේ ජීවිතය දුන්නාවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ වෙනුවෙන් දෙවියන්වහන්සේට ස්තුති කිරීම අපට කිසිදාක නැවැත්විය නොහැක. පාවුල් තුමා මෙසේ කියයි. 1 කොරින්ති 1:4 "ක්‍රිස්තුස් යේසුස්වහන්සේ තුළ නුඹලාට දෙන ලද දෙවියන්වහන්සේගේ අනුග්‍රහය නිසා මම නුඹලා ගැන මාගේ දෙවියන්වහන්සේට නිතරම ස්තුති කරමි."යේසුස්වහන්සේ උදෙසා දෙවියන්වහන්සේට ස්තුති දීමෙන් අපට කිසිවිටකත් වෙහෙසට පත්විය නොහැක. (රෝම 5:8) නමුත් දෙවියන්වහන්සේ අප කෙරෙහි ඇති තමන්වහන්සේගේ ප්‍රේමය පෙන්වන්නේ අප පව්කාරයන්ව, උන්වහන්සේගේ සතුරන්ව සිටියදීම අප වෙනුවට ක්‍රිස්තුස්වහන්සේ මරණය විඳීමට එවීමෙන්ය. (1 පේතෘස් 2:9) යේසුස්වහන්සේ වහන්සේ අපව අන්ධකාරයේ සිට උන්වහන්සේ විශ්මපත් ආලෝකයට කැඳවා ඇත. අපට දෙවියන්වහන්සේගේ දරුවන් වෙන්නට උරුමය දීතිබේ. (යොහන් 1: 12)

අවසාන වශයෙන් සෑම අවස්ථාවන් සහ වාතාවරණයන් උදෙසාම අපි දෙවියන්වහන්සේට ස්තුතිදීම් කරන්නෙමු- 1 තෙසලෝනික 5:16-18) නිතරම ප්‍රීති වෙන්න. 17 නිතරම යාච්ඤා කරන්න. 18 කුමක් සිදුවුනත් නිතරම ස්තුතිවන්ත වෙන්න. මක්නිසාද ක්‍රිස්තුස් යේසුස්වහන්වහන්සේට අයත්වූ නුඹලා ගැන දෙවියන්වහන්සේගේ කැමැත්ත මේය.

දෙවියන්වහන්සේගේ ස්වභාවය සහ උන්වහන්සේ කර තිබෙන සියලුම දේවල් නිසා අපි නිතරම ස්තුතිවන්තව ජීවත්වීම ඉතා අලංකාර දෙයක් නොවේද. පීඩනයෙන් තොර - එවැනි ජීවිතයක් ගැන සිතා බලන්න! රෝම 3:23 සෑමදෙනම පව්කර දෙවියන්වහන්සේගේ මහිමයෙන් හීනව සිටිති."පාපය යනුවෙන් අදහස්වෙන්නේ දෙවියන්වහන්සේ අපට සූදානම්කර තැබූ ඉලක්කය (කිසිම අඩුවක් නැති අංගසම්පූර්ණ) වරදවාගෙන තිබෙන බවයි. පාපයට කුලිය මරණයයි. රෝම 6:23 මෙසේ කියයි:"මක්නිසාද පාපයේ කුලිය නම් මරණයයි, එහෙත් දෙවියන්වහන්සේගේ දීමනාව නම් අපගේ ස්වාමින් වන ක්‍රිස්තුස් යේසුස්වහන්සේ තුළ සදාකාල ජීවනයයි." මේ පදය කියන්නේ අපේ පාපයේ කුලිය/ගෙවීම මරණය බවයි. අප උපයාගන්නේ එයයි. අප මැරෙන්නටත් සදහටම දෙවියන්වහන්සේගෙන් වෙන්වී සිටීමටත් සුදුස්සන්ව සිටින්නෙමු.

පණිවිඩය එතැනින් අවසන් වෙන්නේ නැත! ක්‍රිස්තුස්වහන්සේ අප උදෙසා මළසේක. රෝම 5:8 මෙසේ කියයි, "නමුත් දෙවියන්වහන්සේ අපකෙරෙහි ඇති තමන්වහන්සේගේ ප්‍රේමය පෙන්වන්නේ අප පව්කාරයන්ව සිටියදීම අප වෙනුවට ක්‍රිස්තුස් යේසුස්වහන්සේ මරණය විඳීමෙන්ය." යේසුස්වහන්සේ අපේ තැන රැගෙන අප වෙනුවෙන් මැරුණුසේක. පාපය පරදවා විජයග්‍රහණය කළ බව ඔප්පු කරමින් තුන්වැනි දවසේ යේසුස්වහන්සේ මරණින් නැගිටුනසේක.

උතුම් පණිවිඩය නම් ඔබට ක්‍රිස්තුස්වහන්සේ කෙරෙහි අදහා ගැනීමෙන් ගැලවීම ලබා ගතහැකි වීමයි. එපීස 2:8-9 මෙසේ කියයි, "මක්නිසාද ඇදහිල්ල කරණකොටගෙන ඒ අනුග්‍රහයෙන් නුඹලා ගැලවී සිටින්නහුය. එය නුඹලාගෙන්ම නොව දෙවියන්වහන්සේගේ දීමනාවය. කිසිවෙක් පාරට්ටුකර නොගන්නා පිණිස ඒක ක්‍රියාවලින් නොවේ." මරණයට වඩා ඒ වෙනුවට ඔබ හට සමාව දීමට සහ සදාකාල ජීවනය ලබා දීමට යේසුස්වහන්සේ කෙරෙහි යැපෙන්නට ඔබට පුලුවනි.

යාච්ඤාව: